24 වන පිටෙන්

ගස් සියල්ලේම කිරි එකතු කර ගත හැකිය. කිරි එකතු කරන වේලාව වන විට ගසේ කැපුමේ ඉතිරි වන කිරි, කැපුම මත ඝනවී පට්ටයක් මෙන් සෑදේ. මෙම පට්ටය පසුදින කපන විට ගලවා වෙනම එකතු කර ගනී. 'ඔට්ට පාල් ලෙස හඳුන්වනුයේ මෙම පට්ටා විශේෂයයි. ( හොඳින් ඇදෙනසුලු 'ඔට්ට පාල් වෙසක් කුඩු බැඳීම සහා ඉස්තරම් පට්ටා වර්ගයකි.)

ඊළඟ පියවර වනුයේ එකතු කරගත් කිරි වලින් රබර් නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමයි. ගෙදරට හෝ සැකසුම් මධ්‍යස්ථා නයට ගෙනෙන කිරි, පෙරණයකින් පෙරා, ඒ සහා විශේෂයෙන් සකසා ඇති 'තැටි වලට වත්කර එයට තනුක ඇසිටික් අම්ලය හැඳි කිහිපයක් සහ ජලය නියමිත ප්‍රමාණයක් එකතු කරනු ලැබේ. (සාන්ද්‍ර අම්ලය නියම ප්‍රමාණයට තනුක කර ගැනීම ගැමියා පළපුරුද්දෙන්ම දනී). ඊට පසු කිරි ද්‍රා වණය හැන්දෙන් හොඳින් කූරු ගා, පෙණ


'තැටියක' වත්කර කිරි මිදෙන්නට තැබීම

ඉවත් කර නිශ්චලව තැබිය යුතුය. නවීන 'බඩ්(budded) රබර් ගස් විස්සකින් පමණ ලැබෙන කිරි වලින් එක කිරි තැටියක් සකස් කළ හැකි වේ.

තනුක ඇසිටික් අම්ලය මිශ්‍ර කළ කිරි, පැය හතරකදී පමණ මිදී, මෘදු කැටියක් බවට පත්වේ. රබර් ෂීට් නිෂ්පාදනය සහා මෙම කිරි කැටිය හොඳින් තලා, තුනී කර ගත යුතුය. බොහෝවිට කුඩා ඉඩම් හිමියා, එය ලෑල්ලක් මත තබා අතින් තලා. බොරළු පුරවා බර වැඩිකරගත් බෝතලයකින් එය තවත් තුනීකර, අමු 'රොටියක් සකස් කර ගනී. රොටිය තලා ගැනීම සහා අතින් කරකවනු ලබන 'දිය රෝල් සමහර තැන්වල තිබේ. මීට පසු, තුනී කළ අමු 'රොටිය, 'ඩයමන්ඩ් රෝල නමැති අතින් කරකවන තදින් බර දැමිය හැකි විශේෂ උපකරණය තුලින් යවා තවදුරටත් තුනී කරගනු ලැබේ. මෙම ක්‍රියාව 'රොටි ඇල්ලීමයි මෙසේ කළ විට එහි ජලය බොහෝදුරට ඉවත් වී දාර සහිත තුනී අමු 'රොටියක් ලැබේ. (diamond යන වචනය යොදා ඇත්තේ රොටිය මත ඇතිවන දෙපැත්තට සකස් වන දාර වලින් සෑදෙන 'රූහිත හැඩතල නිසාය* බොහෝ විට කිරි කැපීමේ සිට මේ දක්වා ඇති කාර්යයන් සියල්ලම කරනුයේ රබර් කිරි කපන තැනැත්තා විසින්මය.

මේ ආකාරයට සාදාගන්නා 'අමු රොටි


'ඩයමන්ඩ්' රෝලකින් 'රොටි' ඇල්ලීම

වේලීම මීළ කාර්යයයි. කුඩා රබර් ඉඩම් හිමියා මේ සහා තමන්ගේම දුම් ගෙයක් ප්‍රයෝජනයට ගනී. බොහෝ විට, කටු මැටි ගසා ආවරණය කළ ගැල්වනයිස් තහඩු සෙවිලි කළ කුඩා කාමරය 'දුම් ගෙය යි.

රබර් 'දුම්ගෙය තුළ ඉහලින් සෑදු මැස්සක, හරස් අතට දැමු පොලුවල එල්ලා වැටෙන සේ රඳවනු ලබන 'අමු රොටි දුම් ගසා වේලීම පිණිස, පහලින් ලී කොට දමා ගිනි අවුලවනු ලැබේ. දින දෙක තුනක් තිස්සේ දුම් ගැසීමෙන් පසු ජලය සම්පූර්ණයෙන් ඉවත්වූ 'රොටි, ලා දුඹුරු පැහැයක් ගනී. මේවා 'ශීට් රබර් ලෙස හැඳින්වේ. ආනයනය කරනු ලබන මෙම 'ශීට් රබර් විදේශ වෙළ පලේ හඳුන්වනු ලබන්නේ 'දුම් ගැසූ දාර රොටි (RSS - Ribbed smoked rubber) යන නමින්ය.


ගැමියාගේ කුඩා දුම් ගෙය

එකළ රටෙහි රබර් වගා කළ සෑම ප්‍රදේශ යක්ම, ගම් වල ගැමියා විසින් නිෂ්පාදිත 'දුම් ගැසූ දාර රොටි මිලදී ගෙන ආනයන කරුවන් වෙත යවන වෙළෙන්දෝ සිටියහ. මෙම වෙළ සැල්වල 'අවසර ලත් රබර් වෙළ තැන (Licenced dealer in rubber) යන දැන්වීම දකින්නට ලැබිණ. රබර් නිෂ්පාදක යාට තම භාණ්ඩ මෙම වෙළ සැල් වලට අළෙවි කර, එවලේම මුදල් ලබාගත හැකි විය. නිෂ්පාදනයේ අතුරු ඵලයක් ලෙස සැලකිය හැකි 'ඔට්ටපාල් ද අළෙවි කර අමතර මුදලක් ලබා ගත හැකි, ප්‍රයෝජන වත් අපද්‍රව්‍යයක් විය.

'දුම් ගැසූ දාර රොටි වලට, විදේශ වෙළඳ පලේ ඉතා හොඳ ඉල්ලුමක් තිබේ. විශේෂයෙන්ම වාහන වල ටයර් සහ වෙනත් ගෙවී යාම් වලට තුඩු දෙන ද්‍රව්‍ය නිෂ්පාදනය සහා මෙම රබර් ප්‍රභේදය ඉතාමත් සුදුසු බව නිර්දේශ කර තිබේ.

ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනයේ පුරෝගාමිකයන්වූ, පැරණි ගැමියන් විසින් කරගෙන ආ 'දුම් ගැසූ දාර රොටි නිපදවීම, අද බොහෝ දුරට අක්‍රිය වෙමින් පවතී. මහා පරිමාණයේ රබර් කර්මාන්ත ශාලා මගින් 'අමු කිරි එකතු කර යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් රබර් නිෂ්පාදනය කෙරෙහි යොමුවීම මෙයට ප්‍රධාන හේතුවයි. කෙසේ වෙතත් මේ මගින් රබර් නිෂ්පාදනයේදී ගැමියා මත තිබුණු බර බොහෝ දුරට අඩුවී ඇත. රබර් මුදවා ගැනීම, රොටි සකස් කිරිම, දුම් ගසා වේලීම වැනි භාරදූර ක්‍රියා වලියන් අද ඔහුට නැත. තම රබර් ඉඩමෙන් ලැබෙන අමු කිරි කෙලින්ම එකතු කිරීමේ මධ්‍යස්ථානයකට සැලකියයුතු මිලකට ලබාදී, අද ඔහුට සවස් වරුවේ විවේකයක් ගත හැකිය.

ස්වාභාවික රබර් කර්මාන්තය, ශ්‍රී ලංකාවේ ඉතාමත් සාර්ථක, එමෙන්ම තිරසාර සහ


වෙළඳ පලට යැවෙන 'දුම් ගැසූ දාර රොටි'

සමාජආර්ථික වශයෙන් වැඩදායි, අධිරාජ්‍ය වාදීන්ගෙන් ලැබුණු අගනා සම්පතක් ලෙස සැලකිය හැකිය. රබර් කර්මාන්තයේ නියැලි සිටින රාජ්‍යය සහ පෞද්ගලික ආයතන රාශියක මෙහෙය වීමෙන් රබර් වගාව සහා අවශ්‍ය යටිතල පහසුකම් නොඅඩුව ලැබේ. අගලවත්තේ, 'ඩාර්ටන්ෆීල්ඩ් වතු යායේ පිහිටුවා තිබෙන රබර් පර්යේෂණායතනය, ලොව ඇති පැරණිම රබර් පර්යේෂණායතන වලින් එකකි. ශ්‍රී ලංකාවේ ස්වාභාවික රබර් නිෂ්පාදන අංශය, රටෙහි විදේශ විනිමය උපයන තුන්වන කර්මාන්තය වී තිබේ. රබර් කර්මාන්තය මගින් රටෙහි විවිධ මට්ටම් වල වෘත්තිකයින් තුන් ලක්ෂයකට පමණ රැකියා පහසුකම් සලස්වා දී ඇත.

**(ඡායාරූප කිහිපයක් අන්තර්ජාලයෙනි. ඒවා වෙනුවෙන්, අදාළ ආයතන වලට ස්තුති කරමි.)**


**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au

**මෙම රූපය පුවත්පත ඇත් මෑත් කරමින් බලන්න.**

